# ලොව වටා පුවත් වියමන



ඉකුත් මාසයේ මුළු මහත් ලෝකයේම සුවිශේෂී අවධානය දිනාගත්තේ ලෝක කුසලාන 2010 පාපන්දු තරගාවලියයි. ලෝකයේ විවිධ රටවල් නියෝජනය කරමින් පාපන්දු කණ්ඩායම් 32 ක් සහභාගී වූ මේ තරගාවලිය ජුනි මාසයේ ආරම්භ වූ අතර එහි පූර්ව සහ අර්ධ අවසන් තරග දකුණු අප්‍රිකාවේ ප්‍රමුඛ ක්‍රීඩාංගන 10 කදී පැවැත්විණ. ඒ සඳහා සහභාගී වූ සියළු කණ්ඩායම් අභිබවමින් අවසන් තරගය සඳහා සුදුසුකම් ලද රටවල් දෙක බවට නෙදර්ලන්තය සහ ස්පාඤ්ඤය පත්වූ අතර ඒ කණ්ඩායම් දෙක අතර අවසන් තරගය ජුලි 11 දින දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග්හිදී පැවැත්විණි. එහිදී පැවති තියුණු තරගයකින් පසු ගෝල 1-0 කින් නෙදර්ලන්තය පරදවා ස්පාඤ්ඤය ජය අත්කර ගත්තේය. 19 වන ලෝක කුසලාන පාපන්දු තරගාවලියේදී ස්පාඤ්ඤය ලද මේ ජයග්‍රහණය ලෝක වාසී පාපන්දු ක්‍රීඩා ලෝලීන්ගේ විශ්මයට හේතුවූයේ 1930 මෙම තරගාවලිය ආරම්භවීමේ සිට මේ දක්වා පැවැති කිසිම තරග මාලාවකදී අවසන් වටයට තේරීමටවත් සමත් නොවූ ස්පාඤ්ඤය පාපන්දු ලෝක කුසලානය හිමිකර ගැනීම හේතුවෙනි. එහෙත් ස්පාඤ්ඤය සමග තරග වැදුණු නෙදර්ලන්ත කණ්ඩායම මීට පෙර අවස්ථා කීපයකදීම අර්ධ අවසන් සහ අවසන් වටයනට තේරී තිබූ කණ්ඩායමකි.

## මරාගෙන කතහැකි

ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සමානවම ලෝකයේ අවධානය දිනාගත් තවත් කාරණයක් වූයේ 'පෝල්'ගේ අනාවැකි කීමය. ස්පාඤ්ඤය ජය ගත්තේ  ක්‍රීඩා ලෝලීන්ගේ අනාවැකි බොරු කරමින් පෝල්ගේ අනාවැකි සනාත කරමිනි. මේ අනාවැකිකරුවා කෙරෙහි ලෝකවාසීන්ගේ අවධානය විශාල වශයෙන් යොමුවීමට හේතුව පෝල්ගේ අනාවැකි නිවැරදි වීමත්, අනාවැකිකරුවා මනුෂ්‍යයෙකු නොවීමත්ය.

පෝල් ජර්මනියේ සී ලයිෆ් සෙන්ටර් නමැති මින් මැදුරේ ජීවත්වන බූවල්ලෙකි.

පෝලගේ අනාවැකි ප්‍රකාශයට පත්කෙරුණේ වාචිකව හෝ ලිඛිතව නොවේ. ප්‍රදර්ශණාත්මකවය. කිසියම් තරගයකදී තරග වදින කණ්ඩායම් දෙක නියෝජනය කරන රටවල ධජ සහිත භාජන දෙකකට පෝල් ප්‍රිය කරන ආහාර දමා එම භාජන දෙක පෝල් සිටින ටැංකියට දැමූ විට පෝල් ප්‍රථමයෙන් ආහාර ගන්නේ කුමන ධජය සහිත භාජනයෙන්ද, ඒ ධජය හිමි රට තරගයෙන් ජයගන්නා බවට වන අනාවැකියක් ලෙස නරඹන්නෝ විශ්වාස කළහ. මුලින් අවස්ථාවකදී දෙකකදී පෝල්ගේ අනාවැකි වැරදුනද තරගාවලිය අවසානය වන විට ටක්කෙටම නිවැරදි අනාවැකි ප්‍රකාශ කරන්නට පෝල් සමත්විය. මේ අනාවැකි



කීම නිසා පෝල්ට මරණ තර්ජනවලට මුහුණ දීමට පවා සිදුවිය. ජර්මනියට අවසන් තරගයටවත් සුදුසුකම් ලබන්නට නොහැකිවන බවට පෝල් පලකළ අනාවැකිය නිසා කුපිත වූ ඇතැම් ජර්මාණුවන් කියා තිබුණේ පොල් මරා කෑමට ගත යුතු බවය. මේ හේතුවෙන් පෝල්ට විශේෂ ආරක්ෂාවක් සැපයීමට පවා බාරකරුවන්ට සිදුවිය. කෙසේ වුවද සත්ත්ව විද්‍යාඥයෝ පවසන්නේ පෝල්ගේ අනාවැකි කීම කිසිදු විද්‍යාත්මක පදනමකින් තොර කටයුත්තක් බවය. බූවල්ලන්ට අනාවැකි කීමේ හැකියාවක් ඇති බවට පැතිරෙමින් පවතින මතයද ඔවුහු ප්‍රතික්ශේප කරති. 2010 පාපන්දු ලෝක කුසලාන තරගාවලිය හා බැදුණු සුන්දර මතකයන් අතරට ලේ තැවරුණු බිහිසුණු මතකයක් එක් වූයේ උගන්ඩාවෙනි. රූපවාහිනී ඔස්සේ තරගාවලිය නරඹමින් සිටි කම්පාලා නුවර ක්‍රීඩා ලෝලීන් පිරිසක් වෙත එල්ල කෙරුණු බෝම්බ ප්‍රහාරයකින් පුද්ගලයන් 64 දෙනෙකු ජීවිතක්ෂයට පත්වීම එම සිදුවීමයි.

## නික්මයාම

ජූලි මාසය එලෙස ලෝකයේ පාපන්දු ක්‍රීඩා ලෝලීන්ගේ වෙසෙස් අවධානයට ලක්වූ ආකාරයෙන්ම ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන්ගේද නොමද අවධානයට ලක්වූයේ ලෝකයේ සුපිරි දග පන්දු යවන්නෙකු සිය ටෙස්ට් ක්‍රිකට් ජීවිතයට ආයුබෝවන් කීම හේතුවෙනි. මේ සුපිරි ක්‍රිකට් ක්‍රීඩකයා ශ්‍රී ලංකාවේ මුත්තයියා මුරලිදරන්ය. ජූලි 22 දා ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පැවැති තරගයේ ජය ශ්‍රී



ලංකාවට හිමිකර දෙමින් මුරලි සිය ටෙස්ට් ක්‍රිකට් ජීවිතයෙන් සමුගත්තේ ටෙස්ට් කඩුළු 800 ක් ලබාගත් ක්‍රීඩකයා වීම ඇතුළු නව ලෝක වාර්තා ගණනාවක් තබමිනි.

මේ සිදුවීම් දෙකේදීම රාජ්‍ය නායකයන් විසින් ක්‍රීඩකයන්ට ගෞරව ප්‍රණාම පුද කරනුද දැකගත හැකිවිය. ලෝක පාපන්දු කිරුළ හිමිකරගත් ස්පාඤ්ඤය පිලේ ක්‍රීඩකයන් සිය රට පැමිණි පසු මහත් හරසරින් පිළිගැනීමේ නිල උත්සවයක් පැවැති අතර එයට එරට රජු හොලොස් ජුවාන් ද අගමැතිවරයාද සහභාගී වූහ. මුත්තයියා මුරලිදරන් ටෙස්ට් පිටියෙන් සමුගන්නා අවස්ථාවේ ගාල්ල ක්‍රිකට් ක්‍රීඩාංගනයට ගිය ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මුත්තයියාට විශේෂ සමරු සිහිවටනයක් පිරිනමමින් සිය ප්‍රණාමය පුදකරනු ලැබීය.



ශ්‍රීලාල් සෙනෙවිරත්න

## යුද උණුසුම

ක්‍රීඩාවෙන් බැහැරවූ කල ජූලි මාසය පුරාවට දේශපාලන වශයෙන් ලෝකයේ වැඩිම පිරිසකගේ අවධානයට ලක්වූයේ දකුණු කොරියාව සහ උතුරු කොරියාව අතර වර්ධනය වෙමින් පවතින යුද උණුසුමය. කවර අවස්ථාවක හෝ දෙරට අතර බලවත් යුද්ධයක් ඇවිලිය හැකි බවට වන ඇගවුම් පලවෙමින් තිබිණ. එහෙත් මේ සටහන ලියන අවස්ථාව වන තෙක් ඒ අවාසනාවන්ත පුවත වාර්තා නොවීම සැනසිලිදායකය. කලක් තිස්සේ දෙරට අතර වර්ධනය වෙමින් පැවති මතභේද උග්‍ර අතට පත්කරනු ලැබුවේ ඉකුත් මාර්තු මාසයේ 26 දින දකුණු කොරියාවට අයත් යුද නැවක් සිය මුහුදු සීමාවේදීම අභිරහස් ලෙස  පුපුරා විනාශ වීම හේතුවෙනි. පිපිරීමෙන් එම නෞකාවේ කාර්ය නියුතුව සිටි නාවික සෙබළුන් 46 දෙනෙකු ජීවිතක්ෂයට පත්වූහ. මේ අභිරහස් පිපිරීම පිළිබඳ පවත්වන ලද විශේෂ විමර්ශණයකින්  පසුව පිපරුමට හේතුව ටොපිඩෝ ප්‍රහාරයක් බව දකුණු කොරියාව අනාවරණය කරගෙන තිබිණ. එය උතුරු කොරියාවේ රහසිගත මෙහෙයුමක ප්‍රතිඵලයක් බව නිගමනය කළ දකුණු කොරියාව ප්‍රහාරය සම්බන්ධයෙන් උතුරු කොරියාවට සෘජුවම චෝදනා එල්ල කළේය. උතුරු කොරියාව ඒ චෝදනා ප්‍රතික්ශේප කළේය. කෙසේ වුවද මේ සිදුවීමෙන් පසු දෙරට අතර යුද උණුසුම දැඩි වන්නට විය. දෙපාර්ශවයම අවශ්‍ය විටක එකිනෙකා වෙත බිහිසුණු ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සිය හමුදා සූදානම් කරන්නට පටන් ගත්හ. දෙවන වරටත් දකුණු කොරියාව ඇමරිකාව සමග ඒකාබද්ධ නාවික අභ්‍යාසයක් ක්‍රියාත්මක කරන්නේ එවැනි පසුබිමකය. ජූලි 25 සිට 28 දක්වා කොරියානු අර්ධ දිවීපය ආශ්‍රිතව පැවැත්වීමට සැළසුම් කළ මෙම අභ්‍යාසය සඳහා දෙරටේ යුද නැව් 25 ක්, ගුවන් යානා 200 ක්, හමුදා භටයන් 8000 ක් යොදවා ගැණින. මේ පිළිබඳ අසන්නට ලැබීමෙන් පසු උතුරු කොරියා නායක කිම් ජොංග් ඉල්ගේ 'ජාතික ආරක්ෂක කොමිසම' ජූලි 24 දා ප්‍රකාශ කර සිටියේ මෙම නාවික අභ්‍යාසය ක්‍රියාවට නැගුවහොත් දකුණු කොරියාවට සහ ඇමරිකාවට එරෙහිව න්‍යෂ්ඨික අවි යොදාගෙන ශුද්ධ යුද්ධයක් අරඹන බවය. තම දේශ සීමාව අසල කහ මුහුදට ඇමරිකා යුද නැව් පැමිනෙන බැවින් චීනයද මෙම නාවික අභ්‍යාසයට සිය විරෝධය පළකරනු ලැබීය. උතුරු කොරියාව දකුණු කොරියාවට එරෙහිව සෘජුවම ප්‍රහාර මාලාවක් එල්ල කරනු ඇතැයි ඇමරිකා එක්සත් ජනපද ජාතික බුද්ධි අංශ අධ්‍යක්ෂ ජේම්ස් කැලැපර් එක්සත් ජනපද සෙනෙට් මණ්ඩලයට අනතුරු අගවා තිබුණේද මේ අතරය.

## ඉරාන(ක)ය

ඇමරිකාවේ අවශ්‍යතාවයට යමින් ඉරානයට එරෙහිව යුරෝපා සංගමය මගින් ජූලි මාසයේදී තවත් සම්බාධකයක් පනවනු ලැබීය. ඒ තෙල් හා ගෑස් සම්බන්ධයෙනි. ඉරාන බලශක්ති අංශයට උපකරණ විකිනීම තහනම් කිරීම, තෙල් පිරිපහදු කටයුතුවලට බාධා කිරීම, ඉරාන බල ශක්ති අංශයේ නව ආයෝජන වැළැක්වීම නව සම්බාධකය මගින් සිදුකෙරේ. ඉරානය විසින් සිදුකරන යුරේනියම් බලගැන්වීමේ න්‍යෂ්ඨික වැඩසටහනට එරෙහිව යුරෝපා සංගමය මේ සම්බාධක පනවන්නේ ඇමරිකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉරානයට එරෙහිව අවස්ථා ගනනාවකදීම විවිධ සම්බාධක පැනවීමෙන් අනතුරුවය. මේ සම්බාධක හමුවේ ඉරානය අර්බුධකයක් කරා ගමන්කරමින් පැවතියද මෙවැනි ක්‍රියා මගින් සිය න්‍යෂ්ඨික වැඩපිළිවෙළ නැවැත්වීමට හෝ ඒ ගැන සාකච්ඡා කිරීමට තමන් යොමුකරවා ගැනීමට නොහැකිවන බව ජනාධිපති අහමදිනේජාඩ් ප්‍රකාශ කර සිටී. මේ අතර ඉරානය තුළ විවිධ ප්‍රහාර දියත් වෙන්නට පටන්ගෙන තිබේ. ජූලි 15 ගිනිකොනදිග ඉරානයේදී එලෙස එල්ල කෙරුණු බෝම්බ ප්‍රහාර දෙකක් හේතුවෙන් පුද්ගලයන් 28 ක් ජීවිතක්ෂයට පත්වූ අතර තවත් පිරිසක් තුවාල ලැබූහ. මේ ප්‍රහාර ඇමරිකානු හමුදා සහායෙන් සිදුවූ බවට අහමදිනේජාඩ් චෝදනා කළ අතර ඉරානයේ අධ්‍යාත්මික නායක අයතුල්ලා කුමෙයිනි ප්‍රකාශයක් නිකුත් කරමින් කියා තිබුණේ ඇමරිකා එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය විසින් අවුළුවන මේ ත්‍රස්තවාදයට එරෙහිව මුස්ලිම් ප්‍රජාව ඒකරාශී විය යුතු බවය. කටයුතු සිදුවෙමින් තියෙන්නේ ඉරානයට ඉරාකයට අත්වූ ඉරණමට මුහුණ දීමට සිදුවන ආකාරයෙන් වීම ලෝක වාසී මුස්ලිම් ප්‍රජාවේ දැඩි අවධානයට ලක්වෙමින් තිබේ.

## ජනමාධ්‍යයේ ඉරණම

ඇමරිකාව ඉරාකයට එරෙහිව යුද වැදී එරටට විශාල විනාශයක් සිදුකර තමන්ට අවශ්‍ය ආකාරයේ රූකඩ පාලනයක් ඉරාකයේ ගොඩනගන්නට සමත් වුවද ඉරාකය සාමකාමී රටක් බවට පත්කරන්නට තවදුරටත් අපොහොසත්ව සිටී. ඉරාන මහ මැතිවරණය අවසන් වී සැළකිය යුතු කාලයක් ගතවී අවසානයේත් එරට නව රජයක් පිහිටුවාගැනීමට තවම සමත්වී නැත. වැඩි ඡන්ද ප්‍රතිශතයක් දිනාගත් කණ්ඩායම් හවුල් ආණ්ඩුවක් පිහිටුවා ගැනීම සඳහා තවදුරටත් සාකච්ඡා පවත්වමින් සිටින අතර දිනපතාම පාහේ ඉරාකයේ කොහෝ තැනක බිහිසුණු පිපිරීමක් සිදුවීම මේ වන විට සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. ජූලි 18 දා පෙරවරුවේ බටහිර බැග්ඩෑඩ්හි හමුදා කාර්යාලයකට රැස්වූ 'ෂාවා' සටන්කාමීන් ඉලක්ක කරගනිමින් එල්ල කෙරුණු මරගෙන මැරෙන බෝම්බ  ප්‍රහාරයකින් පුද්ගලයන් 43 දෙනෙකු ජීවිතක්ෂයට පත්ව පනහකට ආසන්න සංඛ්‍යාවක් තුවාල ලැබූහ. 'ෂාවා' සටන්කාමීන් අල්-ක්වයිදා සංවිධානයට එරෙහිව ඉරාක ආණ්ඩුවත් සමග එක්ව සිටින පැරා මිලිටරි කණ්ඩායමකි. ජූලි 26 දා පෙරවරුවේ බැග්ඩෑඩ් නුවර පිහිටි අල්-අරාබියා පුවත්පත් ආයතනයටද මරගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ අතර ඉන් පුවත්පත් ආයතනයේ ලේකම්වරියක ඇතුළු තිදෙනෙක් ජීවිතක්ෂයට පත්ව මාධ්‍යවේදීන් 16 දෙනෙකු බරපතල තුවාල ලැබූහ. මේ ප්‍රහාර අල්-ක්වයිදා සංවිධානය මගින් එල්ල කරන ලද ඒවා බවට විශ්වාස කෙරේ.

ජූලිය අවසානයේ ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූයේ 'විකිලීක්ස්' වෙබ් අඩවිය මගින් ඇමරිකාවේ යුද රහස් හෙළිකිරීම සම්බන්ධයෙන් ඇතිවූ ආන්දෝලනයයි. වාර්තා වූ අන්දමට ඒ වන විට මෙම වෙබ් අඩවිය මගින් ඇමරිකා යුද රහස් 92 000 ක් පමණ හෙළිදරව් කරනු ලැබ තිබිණ. ඉන් වැඩි ප්‍රමාණයක් ඇෆ්ගන් යුද්ධයේදී ඇමරිකා හමුදාවේ අකටයුතුකම් සම්බන්ධයෙනි. ඉරාකයේ බැග්ඩෑඩ් නුවරදී ඇමරිකානු ගුවන් හමුදා හෙළිකොප්ටරයක් මාධ්‍යවේදීන් දෙදෙනෙකු සහ සිවිල් වැසියන් පිරිසක් වෙඩි තබා මරා දමන ආකාරය ඇතුළත් වීඩියෝ පටියක් ඉකුත් අප්‍රේල් මාසයේ මේ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත්කළ අතර එය ලෝකයේ බෙහෙවින් කතා බහට ලක්විය. ඇමරිකාව පවසන්නේ විකිලීක්ස් වෙබ් අඩවියේ මේ අනාවරණයන් සිය රටේ ජාතික




ආරක්ෂාවට තර්ජණයක් බවය. වෙබ් අඩවියේ හිමිකරු ජූලියන් ඇසේන්ජ් පවසන්නේ මාධ්‍යවේදියාගේ වගකීම දෝෂාරෝපනද, ප්‍රසංසාද එකසේ පිළිගෙන ජනතාවට සත්‍ය හෙළි කිරීම බවය. මේ වර්ගයේ මාධ්‍යවේදියෙක් මීට කලකට පෙර ශ්‍රී ලංකාවේද සිටියේය. බොහෝ අංගයන්ගෙන් ඔහු ජූලියන්ට සමාන විය. ජූලියන් මෙන්ම ඔහුද දූෂණ වංචා තොරතුරු හඹායාමේද, ඒවා හෙළිකිරීමේද දක්ෂයෙකු විය. ජූලියන් මෙන්ම ඔහුද නිතර ප්‍රකාශ කළේ කවර අභියෝග හමුවේ වුවද සත්‍ය හෙළි කිරීම මාධ්‍යවේදියාගේ වගකීම බවය. ජූලියන් මෙන්ම ඔහුද මාධ්‍යවේදියාගේ වගකීම ඉටුකරද්දී එය දූෂකයන්ට සහ භීෂකයන්ට අනුව ජාතික ආරක්ෂාවට තර්ජණයක් වන වාර්තා ඉදිරිපත් කිරීමක් විය. ජූලියන් අෆ්ගන් යුද්ධයේ තිරය පිටුපස කතා වාර්තා කළ ආකාරයට ඔහු වාර්තා කළේ එල්ටීටීඊ යුද්ධයේ තිරය පිටුපස කතාය. අවසානයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජාණ්ඩුවක රාජ උදහසට ලක්වූ ඔහු සිය කාර්යාලය වෙත ගමන් කරමින් සිටි එක් උදෑසනක අධි ආරක්ෂක කලාපයක් පෙනෙන මානයේදී මහජනයා බලා සිටියදී අභිරහස් ඝාතක කණ්ඩායමක් විසින් ඝාතනය කරනු ලැබුවේය. ඔහු නමින් ලසන්ත වික්‍රමතුංගය. සන්ඩේ ලීඩර් පුවත්පතේ කතුවරයා වූ ලසන්ත මාධ්‍යවේදියෙකු ලෙසින් දෙස් විදෙස් සම්මානයට පාත්‍රවී සිටි පුද්ගලයෙකි. ඔහු මරාදමා මේ වන විට වසර දෙකකට ආසන්න කාලයක් ගතවී ඇතත් ඔහුගේ ඝාතනය සම්බන්ධයෙන් කිසිම වැදගත් තොරතුරක් අනාවරණය කරගන්නට ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වන බව කියන ශ්‍රී ලංකා පොලීසිය සමත්වී නැත. ජූලියන්ස්ගේ ඉරණම කවරක් වෙනු ඇතිදැයි ඉදිරියේදී අපට දැකගන්නට ලැබෙනු ඇත.

## Try this Magic ......

### MAGIC # 1

An Indian found that nobody can create a FOLDER anywhere on the Computer which can be named as "CON". This is something funny and inexplicable? At Microsoft the whole Team, couldn't answer why this happened! TRY IT NOW, IT WILL NOT CREATE A "CON" FOLDER

### MAGIC # 2

Again this is something funny and can't be explained? At Microsoft the whole Team, including Bill Gates, couldn't answer why this happened! It was discovered by a Brazilian. Try it out yourself?

Open Microsoft Word and type
=rand (200, 99)

And then press ENTER and see the magic?